# ගම්පහ වික්‍රමාරච්චි
# දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## යක්කල

# පුරප්පාඩු

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ පහත සඳහන් පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා සුදුසු සුදුසුකම්ලත් අපේක්ෂකයන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. අධීක්ෂක (භූ අලංකරණ) - III වන ශ්‍රේණිය

**සුදුසුකම් :**

01. i. සිංහල / දෙමළ භාෂාව / ඉංග්‍රීසි භාෂාව හෝ ඉංග්‍රීසි සාහිත්‍ය

ii. ගණිතය

සඳහා සම්මාන සහිතව දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්වී තිබීම.

02. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වසරක ප්‍රායෝගික පුහුණු පාඨමාලාව සම්පූර්ණ කර තිබීම / සමාන සුදුසුකමක් ලබා තිබීම

**වයස :** අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය.

**වැටුප් පරිමාණය :** රු. 31,625 - 7X300 - 10X355 - 37,275 (මාසිකව) - UMT1 (III)A

★★ වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත කරන ලද දීමනා අපේක්ෂකයන්ට ගෙවනු ලැබේ.

**තෝරාගැනීමේ ක්‍රමය :** සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 02. ආරක්ෂක පරීක්ෂක - II වන ශ්‍රේණිය

**සුදුසුකම් :**

01. අ) i. සිංහල භාෂාව / දෙමළ භාෂාව හෝ සාහිත්‍යය

ii. ගණිතය ඇතුළුව

විෂයන් පහක් (05) සඳහා සම්මාන සහිතව දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) අ.පො.ස. (සා./පෙ) විභාගය සමත් වී තිබීම

හෝ

ආ) සිංහල භාෂාව / දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ ගණිතය ඇතුළුව තුනකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්වී තිබීම සමග විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයේ වසර පහක (05) සේවාවක් සාර්ථකව සම්පූර්ණකර ඇති සේවකයන්

හා

02. පොලිසි හා හමුදාවේ හෝ ආරක්ෂක හමුදා සේවයේ හෝ පිළිගත් ආරක්ෂක හමුදා සේවයක අවම වශයෙන් වසර පහක (05) සාර්ථක සේවාවක් සම්පූර්ණකර තිබීම.

03. ක්‍රියාකාරීව ක්‍රීඩාවන් හි සහභාගී වී තිබීම.

04. උස - අඩි 5 අඟල් 4 ට අඩු නොවිය යුතුය.

පපුව - අඟල් 34 ට අඩු නොවිය යුතුය. (සාමාන්‍යයෙන්)

**වයස :** අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය.

**වැටුප් පරිමාණය :** රු. 30,725 - 17X300 - 35,825 (මාසිකව) - UMN 1(IIIA)

★★ වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත කරන ලද දීමනා අපේක්ෂකයන්ට ගෙවනු ලැබේ.

**තෝරාගැනීමේ ක්‍රමය :** සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**පොදු සටහන :**

- සියලුම අයදුම්පත්, ලබාදී ඇති ආකෘතියේ අධ්‍යාපන සුදුසුකම් සහතිකවල පිටපත් සමග, අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කර, 2021 ජූලි 05 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **"සහකාර ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතනික අංශය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, යක්කල"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමුකළ යුතුය.
- රාජ්‍ය සේවයේ, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු සේවකයන් තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් අයදුම්පත් යොමුකළ යුතුය. ඔවුන් කලින් පිටපතක් සෘජුවම විශ්වවිද්‍යාලය වෙත එවිය හැකිය. නිසි ක්‍රමවේදය මගින් නොලැබෙන අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.
- අසම්පූර්ණ, ප්‍රමාදවී ලැබෙන, නියමිත ආකෘතියේ නොවන හෝ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේඛකාධිකාරී,**
**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය,**
**යක්කල.**